www.kidworship.kr


# Triumphal Entry

-Triumphal Entry-



91Page

ඉශ්රායෙල්වරුන්ගේ පසුකර යාමේ මංගල්‍යය උදා වුණා. "පසුකර යමේ මංගල්‍යයෙන්" ඉශ්රායෙල් සෙනග ඊජිප්තුවේ වහල්කමින් මිදී පැමිණීම සමරයි. මෙම මංගල්‍යය සැමරීම පිණිස සැමකෙනෙක්ම යෙරුසලමේ දේවමාළිගාවට එකතුවෙනවා. මෙම පාස්කු මංගල්‍ය සැමරීම පිණිස එදා යේසුස්වහන්සේත් එහි ගියත්, උන්වහන්සේට එහි යාමට තවත් හේතුවක් තිබුණා.



92Page

ඉස්සරහා ඇති ගමට යන්න. ඇතුවෙද්දීම ගැටගසා ඇති කොටළු පැටියෙක් නුඹලාට සම්භවෙයි. ඌ ලිහා ගෙනෙන්න. ඌ ලිහන්නේ ඇයි ? කියා යමෙක් ඇසුවොත්, ඌ ස්වාමින්වහන්සේට අවශ්‍යයි කියා කියන්න.

ගෝලයෝ යේසුස්වහන්සේ ළගට කොටළු පැටියා ගේනවා. ඌගේ පිටේ සළුවක් ලා, යේසුස්වහන්සේ ඌගේ පිට උඩ වාඩිවෙනවා.

උසස් දෙවිඳුන්ගේ පුත්‍ර වූ යේසුස්, යෙරුසලමට ඇතුල්වන්නේ පහත්, නිහතමානී කෙනෙකුන් ලෙයසි.



93Page

විශාල ජනකායක් ෆාම් අතු ඔසවාගෙන කෑ ගසයි. "හොසන්නා.. දාවිත්ගේ පුත්‍රයා, ස්වාමින්වහන්සේගේ නාමයෙන් වඩින ආශීර්වාදලත් තැනැත්තේ මොහුය. බොහෝ සෙනග තමුන්ගේ සළු බිම අතුරමින් ආචාර කරයි. හෝසන්නා උසස් වූ දෙවිඳුන්ට"

යේසුස්වහන්සේ රජෙක් සේ මිනිසුන් විසින් පිළගනු ලැබුවා.

යේසුස්වහන්සේගේ ගෝලයන්ට හරිම ආඩම්බරයි.

"වාව් ! යේසුස්වහන්සේ කඩවසම් නේද? තව ටිකකාලයකින් එයා රජතුමා වෙයි. එයා රජ වුණාම මම එයාගේ මන්ත්‍රී කෙනෙක් වෙලා එයාට උදව් කරනවා. මටත් පුලුවන් වෙයි උන්වහන්සේගේ පැත්තකින් සිටිමින් වැඩකොටස් කරන්න. හිහ්හී හිහ්හී... "

නමුත්, ජනතාව දක්වන මේ ආචාරය හැමදාටම නොවන බව යේසුස්වහන්සේගේ දැනගෙන සිටියා. දෙවියන්වහන්සේගේ රාජ්‍යය යනු මේ ලෝකයෙන් හම්භවෙන මහිමය නොවන බව යේසුස්වහන්සේ සිතුවා. යේසුස්වහන්සේ යෙරුසලමට ඇතුල්වුණේ, පව්කරුවන් උදෙසා කුරුසිය දරන්නයි.



94Page

යේසුස්වහන්සේ ඊශ්රායෙල් හී දේව මාළිගාවට ඇතුල් වෙද්දීම වටපිට බැලුවා. දේව මාළිගාව ඇතුළට ආවාම, එහි මිල මාරුකරමින් සිටි වෙළෙන්දන් පිරී සිටිනු දැක පුදුම වුණා. මේවා දුටු යේසුස්වහන්සේ කෝපයෙන්, මුදල් මරු කරන්නන්ගේද, වෙළෙන්දන්ගේද, මේස පෙරළා දැමූ අතර කිසිවෙකුට දේවමාළිගාව සතු කිසිවක් ගෙන යන්නටද ඉඩ දුන්නේ නෑ."මේ මාගේ ගෘහය. එය සියළු ජාතීන්ට යාච්ඤාවේ ගෘහයක්ය. ඒත් නුඹලා ඒක සොරුන්ගේ ගුහාවක් කරලා...!! "



95Page

දේවමාළිගාවේ වෙළෙන්දන් සහ භාණ්ඩ මිලදී ගන්නන් උන්වහන්සේ විසින් පන්නා දමනු ලැබුවා. මේ වෙලාවේ ප්‍රධාන පූජකයන් සහ ව්‍යවස්ථාව උගන්වන්නන් යේසුස්වහන්සේව මරණ පිණිස සැලසුම් කළා. හැමකෙනෙක්ම යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අහලා පුදුමවන නිසා, ඔවුන් උන්වහන්සේට භය වුණා. දෙවියන්වහන්සේගේ වචනය උගන්වන්-නත්, තේරුම් කරලා දෙන්නත්, බලය ලැබුණේ ඔවුන්ට පමණක්ය කියා ඔවුන් විශ්වාස කළා.